# බොම්බාය ගිනිගත් දවස
## The day Mumbai was set alight



# WHY INDIA SHOULD MIND HER OWN BUSINESS
## ඉන්දියාව තමන්ගේ වැඩක් බලාගත යුතුය

**1.** They may be strong in armed forces but still they can't find a proper solution to **Kashmir Problem** (neither military nor political).

**2.** No matter how strong they are they still have terrorism problems like Chain Bombardments in Delhi and attacks even inside their Parliament, now recently the massacre in Mumbai.

**3.** With all the technology to win space and with all the high tech gadgets in nuclear weaponry they took more than 30 years to capture a single jungle thief **Veerappan.**

**4.** As a nation, collectively they are unable to derive a proper political solution to have a good relationship with **Pakistan** for more than 6 decades.

**5.** Their politicians are still unable to convince **Indian Muslims and Hindus** to live in peace and harmony.

**6.** India had to draw back their **RAW** (Research and Analysis Wing - Indian intelligence) wing due to their unsuccessful interference in SL that resulted in sacrificing their Prime Minister Mr. Rajiv Gandhi. So they have been unsuccessful in this matter once. SO their predictions are not always correct even though they pretend to think so.

**7.** India is one of the major parties who aggravated **SL** problem. They trained LTTE terrorists initially in south India including **Prabakaran, Pottu Amman** and **Karuna Amman**. They air supplied foodstuff in the past to LTTE. South India continuously smuggle combat stuff to LTTE.

**8.** As a nation no matter how hard they try to display a big image of their selves they have critical issues in their own country. They have racial issues, religious issues, economical issues, social issues, cast issues and political issues. **It is not the country we see in Bollywood films.** Besides it is highly unethical to interfere in the matters of another independent nation. India simply doesn't have rights to do that.

**9.** South Indian politicians can come to SL and travel through out the country to see where ethnic cleansing is. All the southern cities and all the offices there have Tamils living and working in harmony. But any of the northern cities don't have a single Sinhalese. So where is ethnic cleansing ? So better not use unknown matters for their personal political gains.

**10. We Sri Lankans don't have any other country to live in other than Sri Lanka. So if anybody wants to give Tamils a separate country, first separate south India (Tamil Nadu) from what we currently call India, just like Pakistan and Bangladesh, and create a separate state for Tamils in the world. Tamil Nadu has all the necessities for them. Karunanidhi once vehemently campaigned for a DRAVIDSTAN there.**

**ඉ**න්දියාවට ශක්තිමත් හමුදාවන් සිටින බව සැබෑය. එහෙත් ඉන්දියාවට තවම කාශ්මීර ප්‍රශ්නයට විසඳුමක් සොයාගත නොහැක.

කොපමණ ඉන්දියාව ශක්තිමත් වුනත් වැඩක් නැත. ත්‍රස්තවාදීහු එහි හැම නගරය කටම ගොස් සිත්සේ බෝම්බ පුපුරවති. එය වලක්වන්නට ඉන්දියාවට නොහැකිය.

න්‍යෂ්ඨික අවි ආයුධ හා නවීන යුද උපකරණ ඇතැයි ඉන්දියාව උදම් ඇනුවත් වීරප්පන් නමැති එක කෙසහ හොරෙකු අල්ලා ගන්නට අවුරුදු 30කට වඩා ගතවිය.

ජාතියක් හැටියට ඉන්දියාවට අසල්වැසි පකිස්ථානය සමග මිත්‍රත්වයක් ඇතිකර ගන්නට අවුරුදු 60ක් ගෙවීත් තවම බැරිවිය.

ඉන්දියාවේ දේශපාලකයන්ගේ කට විතරය. තම රටේ හින්දු හා මුස්ලිම් ජනතාවට සමගිව වසන්නට උගන්වන්නට ඒ දේශපාලුවන්ට මෙතෙක් හැකිවී නැත.

**RAW** රෝ නමැති ඉන්දියානු බුද්ධි අංශයට එතරම් බුද්ධියක් ඇතැයි නොසිතේ. ශ්‍රී ලංකාවේ ප්‍රශ්නයට අත දාන්නටත්, ඉන්දියන් හමුදා ලංකාවට එවන්නටත් උපදෙස් දුන්නේ ඒ රෝ ය. රජීව් ගාන්ධි මියගියේ ඒ වැරදි උපදෙස නිසා ය.

ශ්‍රීලංකා ප්‍රශ්නය උග්‍ර කළේ ඉන්දියාවයි. ප්‍රභාකරන්, පොට්ටු අම්මාන් හා කරුණා ආදී කොටි ත්‍රස්තවාදීන් පුහුණු කළේත්, පුහුණු කඳවුරු තමිල්නාඩුවේ ඉදිකළේත් ඉන්දියාවයි. කොටින්ට එහි සිට ආයුධ සහ කෑම ද්‍රව්‍යයද හොර රහසේ එහෙත් ඉන්දියාව දැනුවත්ව ප්‍රවාහනය කෙරිණ.

ඉන්දියාව කලාපයේ බලවතා ලෙස පෙන්වන්නටද සංස්කෘතියක් ඇති ශිෂ්ට සම්පන්න ජාතියක් ලෙස කැපී පෙනෙන්නට උත්සාහ කරන නමුත් එහි ජාති, කුල, ආගම් ආදී ලෙසත්, දිළිඳුකම සහ නූගත්කම නිසාත් බෙදුණු ජනතාවන් සිටින, දහසක් ප්‍රශ්න කැකෑරෙන රටකි. බොලිවුඩ් හින්දි චිත්‍රපටවල පෙන්වන සෝබමාන ලෝකය කිසිත් එහි නැත.

ශ්‍රී ලංකාවාසීන්ට, විශේෂයෙන් සිංහලයින්ට ශ්‍රීලංකාව හැර තව රටක් නැත. ලංකාව බෙදා වෙනම දෙමළ රටක් තනන්නට යනවා නම් ඊට වඩා සුදුසු පකිස්ථානය හා බංගලා දේශය කැඩූ විදියටම තමිල්නාඩුව දෙමළ රටක් ලෙස කඩා වෙන්කර දීමයි. ඒ පෙදෙස ඊට වඩාත් සුදුසුය. කලකට පෙර කපටි කරුණානිධි දකුණු ඉන්දියාවේ ද්‍රවිඩස්ථානයක් තැනීම සඳහා විශාල ව්‍යාපාරයක් ගෙනගියා අපට මතකය.



කරුණා තද කොටියෙකු කාලේ

# කරුණාගේ කාඩරයන් හමුදාවට සුදුසුද?

**කො**ටි ත්‍රස්තවාදය අත්හැර සීඝ්‍රගාමීව සුදනෙකු හා මන්ත්‍රී කෙනෙකු බවට පත්වූ විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් මේ ළඟදී බීබීසී ගුවන්විදුලියට දුන් සාකච්ඡාවකදී හෙළිකළේ නැගණහිර පළාතේ සිටින තම ගෝල පිරිස ළඟදීම ශ්‍රීලංකා හමුදාවට භටයන් ලෙස බැඳෙන බවයි. ඒ සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය තමාට ළඟදීම ලැබෙන බවද ඔහු කීවේ ය.

කරුණාගේ ඒ කතාව ඇත්ත නම් රජයේ පැත්තෙන් ඒ ගන්නට යන්නේ හරි පියවරක් දැයි ඇසිය යුතුව තිබේ. කොටි හමුදාව හා ත්‍රස්තවාදය අතහැර එන බව කියන හැම කාඩරයෙකුම ආ සැනින් මූණ ඉඹ තුරුළට ගන්නට ලැස්තිවීම එතරම් හොඳ සඥාවක් නොවේ. ඔතරම් ඉක්මන් විය යුතු ද නොවේ.

කරුණාගේ ගෝලයන් හා ප්‍රභාකරන් ගේ ගෝලයන් දෙගොල්ලම මුල සිටම පුහුණුව ලබා ඇත්තේ සිංහළ ජනතාව ඝාතනය කිරීමට හා රට විනාස කරන ක්‍රියාවන් සඳහාය. ඒ ත්‍රස්තවාදී කඳවුරුවල සිංහළ ජනතාව කෙරෙහි වෛරය ඇතිවන දේශනද වීඩියෝ පට ද පෙන්වමින් දෙමළ තරුණ තරුණියන්ගේ මොළය සේදූ බව අසා ඇත්තෙමු. එවැනි පරිසරයකින් ආ කරුණාගේ **TVMP** භටයන්ගේ සිත් හි තවම ඒ වෛරයේ ගිනි පුපුරු නොතිබෙනවා යයි අපට කිව හැකිද?

ආරක්ෂක හමුදාවන්හි සිටින්නේ රට ජාතිය මුදාගැන්මට කැපවූ විනයානුකූලව හැඩ ගැසුණු පිරිසකි. ඔවුන් මෙතෙක් කළේ දිවි දුන්නේ රට ආරක්ෂා කිරීමට ය. එය කරුණාගේ ගෝල පිරිස නිරතවූ ක්‍රියාවන්ට හාත් පසින්ම වෙනස් වූවකි. එවැනි දෙගොල්ලක් එකම හමුදාවක ඉදීම කෙසේ නම් පෑහේද? එය ඉදිරි අනාගතයේදී අප හමුදා සේනාංකයන්හි තත්වය විනය හා මානසිකත්වය බිඳ දමන අයෝග්‍ය සැලැස්මකි.

කරුණාගේ ගෝලයන්ට අවශ්‍ය නම් වෙනත් රැකියා දිය හැකිය. උතුරු නැගණහිර සංවර්ධන වැඩ කොතෙකුත් ඇත. ඒවාට යන්නට නොසිතන්නේ ඇයි? කොටි හමුදාවේ ත්‍රස්තවාදීන් ලෙස සිටි කිසිම කෙනෙක් ලංකා හමුදාවට ගතයුතු නොවේ. අනෙක ඔවුන් හමුදාවකට පමණක්ම සුදුසු යයි සිතන උඩඟු මානසිකත්වයක් ඔවුනට කොහෙන් ආවේද?

දැනට සූට් එකකින් සැරසී සිටියත් කරුණා පරණ කොටියෙකු බව අප අමතක නොකළ යුතුය. ඔහුගේ ඉදිරි සැළසුම් මොන වාදැයි අපි නොදනිමු. ප්‍රභාකරන් අල්ලා ගත් පමණින් මේ ඊළම් යුද්ධය අවසන් නොවේ. ඒ තැනට එන්නට සූදානමින් තවත් බොහෝ අය සිටිනවා ඇත. අද දිවිපුදා රට රකින හමුදාවේ තරුණ පෙළට හෙට දිනයේත් ඒ කාර්‍යය මෙයට වඩා ඉතා අමාරුවෙන් කරන්නට සිදුවෙනවා නියතය. ඒ නිසා ඔවුන්ගේ චිත්ත ධෛර්‍යය නසන කිසිදු හානිදායක පියවරක් රජය අද නොව කිසි දිනක ගතයුතු නොවේ.

♦ **විස්කම් සෙනෙවිරත්න**
**යක්කල Sri Lanka**






# ඌරු මීයෙකුගේ කෙඳිරිගෑම

**ඌ**රු මීයා කියන්නේ මොකාදැයි මුලින්ම මං කියා දෙන්න යන්නෙ ටවුමේ ජීවත්වන කස්ටිය වහලේ හා ගෙයි දුවන කොස්ඇට මීයන් හැර වෙනත් මීයන් ගැන දන්නේ නැති නිසයි. ඌරුමීයා ඉන්නෙ කලෑවෙ. නැත්නම් වත්තෙ පඳුරු තියන හරියෙ. කිසියම් බෝග ජාතියක් හිටෙව්වම, විශේෂයෙන් බතල, මඤ්ඤොක්කා වගේ අලවර්ග බහින කොට ඌරු මීයා පොළව හාරල අර අල ටික කනවා. ඌ ජීවත්වෙන්නෙ පොළව යට හිල්වල. මූ සාමාන්‍ය බටු මීයන්ට වැඩිය සැහෙන්න ලොකුයි.

ලංකාව විනාස කරන්න ඉපදිච්ච මහ කොටියා වන ප්‍රභාකරන් දැන් සැහෙන කාලයක ඉඳලා ජීවත්වෙන්නෙ ඌරු මීයෙක් වගේ. කිලිනොච්චියෙ පොළව යට හදපු බංකරේක, නැත්නම් මී ගුලක. හෙට අනිද්දම ඒ මී ගුලේ හැටි අපට බලාගන්න පුළුවන්. දැන් අවුරුදු කීපයක් තිස්සේ නොවැම්බර් මාසෙ 26 වෙනිදා මේ යකා කරන මහා පාරම්බෑම තියන දවස **ටැමිල් නෙට්** ඇතුළු දෙමළ වෙබ් අඩවිවලයි, දෙමළ පත්තරවලයි යන්නෙ **මාවීරර් නාල්** හෙවත් **මහා වීර දිනය** කියලා.

මට හැම තිස්සෙම කල්පනා වෙන දෙයක් ප්‍රභාකරන් ඇතුළු කොටි සංවිධානෙ ඉන්න සහ හිටපු සේරම මිනීමරු ත්‍රස්තවාදියො හැත්ත වීරයො වුණේ කොහොමද කියලා. මිනී මරණවා, රට විනාසකරනවා, ඉවක් බවක් නැතුව බෝම්බ පුපුරවනවා ඇරෙන්න මුන් කරපු වීර ක්‍රියාව මොකක්ද? එහෙනම් හිට්ලර් වීරයෙක්. මුසෝලිනී වීරයෙක්. කාම්බෝජෙ පොල්පොට් වීරයෙක්. පාතාලෙ ඉන්න අපරාධ කාරයොයි මේ ලෝකෙ ඉන්න ඔක්කොම මිනීමරුවොයි වීරයො හැටියට අපි පිළිගන්න ඕන.

ප්‍රභාකරන්ට වීරත්වය දුන්නු අය අතරෙ අපේ සමහර සිංහළ ගොං දේශපාලකයොයි, සමහර බූරු මාධ්‍යකාරයොයිත් හිටියා. තවමත් ඉන්නවා. උන් මහකොටියාගේ ඒ පාරම්බෑම කල්තියාම ලංකාවෙ ඉන්න සාමාන්‍ය මිනිස්සුන්ට දන්වන්නෙ සැහෙන බයකුත් ඒ මිනිස්සුන්ගෙ හිත් ඇතුළට දාලා.

"මේ සැරේ වීර දිනයට ප්‍රබාකරන් එයාගෙ කතාවෙ මොනව කියාවිද දන්නෙ නෑ. මේ සැරේ මිනිහා ටිකක් සිංහළ මිනිස්සු ගැන අනුකම්පාවෙන් කතා කරයිද දන්නෙ නැහැ. එහෙම කළොත් නම් හොඳයි. මැන්ට තරහ ගියොත් ඉතින් මේ හැම තැනම බෝම්බ පුපුරවන්න පටන් ගනීවි, එතකොට ඉතින් හරි වැඩේ තමයි." ඔන්න ඔය විදියටයි අපේ රටේ ගොං හැත්ත ප්‍රභාකරන් මිනීමරුව උස්සලා තිබ්බෙ, මහා වීරයෙක් කළේ.

එංගලන්තෙ වසරක් පාසා මහ රැජිණගෙ කතාවක් රූපවාහිනියෙන් සහ ගුවන්විදුලියෙන් විකාශනය වෙනවා. ඒක බ්‍රිතාන්‍යයේ පාරම්පරික දෙයක්. ඒ කතාවට විශේෂ තැනක් ඉංග්‍රීසි මිනිස්සු දෙනවා. ඒ වගේම තමයි ලංකාවෙ ඒකාලෙ තිබුණු **රාජාසන කතාව**. ඒකෙ අග්‍රාණ්ඩු කාරයා රජයේ ඉදිරි වැඩ පිළිවෙල විස්තර කළා. ප්‍රභාකරන් කියන ත්‍රස්තවාදියගෙ තතාවටත් වීරත්වයක් දුන්නෙ ඒ රාජාසන කතාවට සමානව. කොටින්ගෙ සල්ලි වලින් යැපෙන බීබීසී මාධ්‍යකාරයොත් මේ ඌරුමීයා කිලිනොච්චියෙ පොළව යට මී ගුලේ ඉඳන් කරන පාරම් බෑම මහ රැජිණගේ කතාවට (Queen's Speech) සමාන විදියට වැදගත් කමක් දීලයි ලෝකයාට විකාශනය කළේ.

මේ උඩම තියන ප්‍රභාකරන් කතාකරන පින්තූරය මේ සැරේ ගත්තු එකක් නෙවෙයි. පරණ එකක්. ගිය අවුරුද්දෙ කතාවටත් පාවිච්චි කළේ මේ පින්තූරෙමයි. දැන් කිලිනොච්චියෙ මී ගුලේ ඔය ආටෝපෙවත් සැප පහසුකමවත් නැහැ. ඒ වුනාට මේවා මේ විදියට දාන්නෙ ප්‍රභාකරන් තවම කෙළින් කටින් ඉන්නවා කියලා ලෝක දෙමළ ප්‍රජාවට පෙන්නන්න. නැත්නම් වස ලැජ්ජාව. නමුත් කවුරුත් දන්නවා මේක මහා බොරුවක් බව.

මේ සැරේ මීගුලේ ඉඳගෙන ප්‍රභාකරන් කෙඳිරිගගායි කතා කළේ. අර වෙනද තිබුණු එම් ජී ආර්, වීරප්පා ලෙවල් එකේ ගැලරියේ දෙමළ ජනයාගෙ විසිල් වදින ගතිය මේ සැරේ පලා තකවත් නැහැ. වීරදිනයේ කතාවය කියලා පත්තරවලටයි මාධ්‍ය ආයතන වලටයි යවපු පිටපතේ තිබුණේ 'ඉන්දියාව අපේ කවදත් යාළුවය, අපි සාමකාමී බෝසත් ගතිගුණ තියන අයය, අපි හීනෙකින්වත් කාටවත් හිංසාවක් කරලා නැත. බොරු නම් රජීව් ගාන්ධි මහත්තයගෙ නෝනගෙන් අහන්නය, අපි ඉන්දියාවට කියන්නෙ මේ අවස්ථාවෙ අපිට සපෝට් කරන්නය කියලයි.'

"මුම්බායෙයි තව තව තැන්වලයි උඹලා වගේම ත්‍රස්තවාදියො බෝම්බ පුපුරවලා ඉන්දියාව මේ හොල්මන් වෙලයි ඉන්නෙ, ඒ අස්සෙ උඹ කියනවා සපෝට් කරන්නලු, අපේ ඔලුව ගිනිඅරන් තියෙන්නෙ. උඹ පුළුවන් විදියට බේරියන් මලේ" කියලා **මන්මෝහන් සිං** කිව්වයි කියලයි දැන් ආරංචිය.

♦ **වෙලේගෙදර රාළ London**